IFLA Section Environment, Sustainability and Libraries

**පරිසරය, තිරසා රත්වය සහ පුස්තකාල පිළිබඳ IFLA අංශය**

## හරිත පුස්තකාලයක් යනු කුමක්ද?

පරිසරය යන්නෙන් අදහස් කරන්නේ මිනිසුන්, සංවිධාන, සතුන් හෝ ශාක ජීවත් වන සහ ක්‍රියාත්මක වන වටපිටාව හෝ තත්වයන් ය. පරිසරය ස්වභාවික, සමාජීය හෝ සංස්කෘතික විය හැකිය.

තිරසාර සංවර්ධනය යනු "අනාගත පරම්පරාවට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාවන්ට බාධාවක් නොවන පරිදි වර්තමාන ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලමින් සිදු කරනු ලබන සංවර්ධනයයි (Our Common Future, Brundtland Report, UN).

වර්තමාන පරිසරය දේශගුණික විපර්යාස සහ සමාජ අසමානතා ඇතුළු අනෙකුත් තර්ජන මගින් තර්ජනයට ලක්ව ඇත. තිරසාර සංවර්ධනය මඟින් පරිසරය සුරැකීමට සියලු සංවිධාන කටයුතු කළ යුතුය. තිරසාර සංවර්ධනය සඳහා සක්‍රීයව හා වැදගත් කාර්ය භාරයක් ඉටු කළ හැකි සියලුම පුස්තකාල මීට ඇතුළත් වේ.

හරිත හා තිරසාර පුස්තකාලයක් යනු පාරිසරික, ආර්ථික සහ සමාජීය තිරසාරභාවය සැලකිල්ලට ගනු ලබන පුස්තකාලයකි. හරිත හා තිරසාර පුස්තකාල විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත විය හැකිය, නමුත් ඒවාට පහත සඳහන් පරිදි පැහැදිලි තිරසාර න්‍යාය පත්‍රයක් තිබිය යුතුය.

- **හරිත ගොඩනැගිලි සහ උපකරණ:** ගොඩනැගිල්ලේ සහ උපකරණවල විමෝචනය හෝ කාබන් පියසටහන ක්‍රියාකාරී ලෙස අඩු වේ.
- **හරිත කාර්යාල මූලධර්ම:** මෙහෙයුම් චර්යාවන් සහ ක්‍රියාවලීන් පාරිසරික වශයෙන් තිරසාර වේ.
- **තිරසාර ආර්ථිකය:** පරිභෝජනය සීමා කර ඇත, චක්‍රීය සහ බෙදාගැනීමේ ආර්ථික භාවිතයන් දියුණු වන අතර ප්‍රජාවට ප්‍රවේශ විය හැකිය.
- **තිරසාර පුස්තකාල සේවා:** : පුස්තකාල භාවිතා කරන්නන් හට අදාළ සහ යාවත්කාලීන තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම, හවුල් අවකාශ, උපාංග සහ පාරිසරික අධ්‍යාපනය ලබා දීම සහ කාර්යක්ෂමව මෙහෙයුම් ලබා දීම. පුස්තකාලයේ ධනාත්මක කාබන් අත් සලකුණක් තිබීම.
- **සමාජ තිරසාරත්වය:** හොඳ අධ්‍යාපනය, සාක්ෂරතාවය, ප්‍රජා සහභාගීත්වය, හරස් සංස්කෘතික විවිධත්වය, සමාජ ඇතුළත් කිරීම් සහ සමස්ත සහභාගීත්වය සලකා බැලීම. අසමානතාවය අවම කිරීම සඳහා පුස්තකාලය සක්‍රීයව දායක වීම
- **පාරිසරික කළමනාකරණය:** පාරිසරික ඉලක්ක SMART (නිශ්චිත, මැණිය

හැකි බව, ළඟා කර ගත හැකි බව, ප්‍රායෝගික බව, කාලය හා ඇති බැඳීම) වන අතර, පුස්තකාලය පරිසරයට සෘණාත්මක බලපෑම අඩු කිරීමට කටයුතු කරයි. පුස්තකාලයේ පාරිසරික ප්‍රතිපත්තිය, එය ක්‍රියාත්මක කිරීම සහ පාරිසරික කටයුතුවල ප්‍රතිඵල පුළුල් ප්‍රේක්ෂක පිරිසකට සන්නිවේදනය කෙරේ.

- **සාමාන්‍ය පාරිසරික ඉලක්ක සහ වැඩසටහන් සඳහා කැපවීම:** කැපවීම සඳහා මඟ පෙන්වනු මෙහෙයවනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක, දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම සහ අදාළ පාරිසරික සහතික සහ වැඩසටහන් මගිනි.

Translated from English into Sihala language by H.P. Koralage, W.P.G.L. Perera, M.A. Lankathilaka, A.K.U.N, and Kodithuwakku